## 6 වන පිටුවෙන් (ධනවතකු වන මග)

"ඕනෑනම් මට ඒ මහත්තයාගේ ටෙලිෆෝන් නොම්මරේ දෙතහැකි. ගුණදාස මහත්තයාට කෝල් එකක් දාලා ඕනෑ විස්තරයක් දැනගන්න පුලුවනි. මං කවුදැයි කියලා කියන්නකෝ.."

"අනේ සර් දෙන්නකෝ."

ගුණදාස මහත්තයා බ්‍රහ්මපුත්‍ර නමැත්තකුගේ දුරකතන අංකය ලියා ගත්තේ ය. ධනවර්ධනට ස්තුති කොට සංවාදය නිම කළේය.

වේලාව නවයයි. බ්‍රහ්මපුත්‍ර දැන් කාර්යාලයට අවුත් සිටිය යුතුය. ගුණදාස ධනවර්ධන දුන් අංකයට ඇමතුමක් ගත්තේ ය. තමාට ආදායම් බදු ගෙවීම පිළිබඳ උපදෙස් කීපයක් ලබාගත යුතුව ඇති බව කී ගුණදාස අංකය ලබා ගත්තේ "ධනවතෙක් වන්නේ කෙසේ ද?" පොතේ කර්තෘ මහාචාර්ය ධනවර්ධනගෙන් බවද කීය.

"හරි හරි. මහත්තයා ඕනෑ දෙයක් අහන්න. අපි ඉන්නේ උදව් කරන්න තමයි. මහත්තයට ආදායම් බදු ෆයිල් එකක් තියෙනවද?"

"එහෙම එකක් නං තවම නෑ.."

"හරි දැං මොකක් ද ගුණදාස මහත්තයට අපෙන් දැනගන්න ඕනෑ..?"

"සර් තට්ටු පහේ ගොඩනැගිල්ලක් මාසෙට ලක්ෂ දෙක ගානේ කුලියට දුන්නම ආදායම් බදු කීයක් ගෙවන්න වෙනව ද?"

"ගුණදාස මහත්තයා කොහේ ඉඳලද කතා කරන්නෙ?"

"මම මරදානේ සර්?"

"කොහේද ඔය ගොඩනැගිල් තියෙන්නේ?"

"මරදානේ සර්.. "

"මාසෙකට ලක්ෂ දෙකයි කියන්නෙ අවුරුද්දට ලක්ෂ විසි හතරයි. ඕනෑම පුද්ගලයෙක් ලබන ආදායමෙන් මුල් රුපියල් ලක්ෂ තුන ආදායම් බද්දෙන් නිදහස්. තේරුනා නේද?"

"එහෙමයි සර්.."

"ලක්ෂ තුනෙන් එහා ආදායමෙන් සීයේට තිස් පහක් ගෙවන්න ඕනෑ.. එතකොට විස් එක් ලක්ෂෙකට සීයේට තිස් පහ ගානේ . ඔහොම ඉන්න පොඩ්ඩක්.."

බ්‍රහ්මපුත්‍ර කැල්කියුලේටරය අතට ගන්නට ඇතැයි ගුණදාසට සිතුණි.

"හරි. හත් ලක්ෂ තිස්පන්දාහක් ගෙවන්න ඕනෑ.."

"අයියෝ සර්. හරිම අසාධාරණයි නෙ.."

"අපි නෙවෙයි අසාධාරණ.. ඔය මහත්තයා අවුරුද්දකට ගොඩනැගිලි කුලිය විතරක් විසිහතර ලක්ෂයක් සොයන මිනිහා මේ වෙනකං සත පහක ආදායම් බද්දක් ගෙවලා නෑ. තමුං බරපතල වංචාවක් කරලා තියෙන්නෙ. අපි වහාම මේ පිලිබඳව පරීක්ෂණයක් පටං ගන්නවා.."

සිනාමුසුව ගුණදාස ඒ ගොරණාඩුව අවසන් වන තුරු අසා සිටියේ ය.

"ඔය ගොඩනැගිල්ලේ පිහිටීමයි වරිපනම් අංකෙයි මට දැන් දෙනව ද?"

"සර් පොඩි ප්‍රශ්නයක් තියෙනවා.."

"පොඩි ප්‍රශ්නයක් නෙවෙයි ගුණදාස මහත්තයෝ ලොකු ප්‍රශ්නයක්."

"නෑ නෑ සර්. කලබල වෙන්න එපා. මං කියන්නං කතන්දරේ. මම හෙට අලුත් ව්‍යාපාරයක් පටන් ගන්නවා. කං කුං විකුණන එක. පිටකොටුවෙන් කං කුං අරගෙන ඊට පස්සෙ ගෙයක් ගෙයක් ගානේ ගිහින් විකුණනවා. අර පොතේ හැටියට මම ඉක්මණින් ධනවතෙක් වෙනවා.. අපේ ගේ ඉස්සරහා තියෙනවා ඉඩමක්.. පර්චස් 20 ක හිස් ඉඩමක්.. මං ඒක සල්ලි දීලා ගන්නවා.. ඊට පස්සේ තමයි එතන තට්ටු පහේ බිල්ඩිම ගහල කුලියට දෙන්නෙ.. "

දඩාස් ගා අනෙක් පැත්තෙන් රිසිවරය වේගයෙන් තබන හඬ ගුණදාසට ඇසිණි.

## 4 වන පිටුවෙන් (මහ විරු කතාව)

යුද මෙහෙයුම් කණපිට හරවන සිදුවීමක් සිදුව ඇත. බොම්බායේ ප්‍රහාරයත් සමගම වන්නියේ ප්‍රහාර ගැන කියමින් ඉන්දිය මධ්‍යම රජයට බලපෑම් කරන්නට තමිල්නාඩු දේශපාලනඥයන්ට නොහැකිය. මන්ද මන්මෝහන් සිංට මෙන්ම සෝනියා ගාන්ධිට කිලිනොච්චියට මූලතිව්වලට වඩා බොම්බාය වැදගත්ය. එනිසා ප්‍රභාකරන්ගේ ඉල්ලීම් කවරක් වෙතත් ඉස්ලාම් ත්‍රස්තවාදයට එරෙහි දැවැන්ත සටනක් ආරම්භ කිරීමට ඉන්දීය මධ්‍යම ආණ්ඩුවට සිදුව ඇත. පසුගිය වසර 3 ඇතුළත ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලදී සිදුවූ ත්‍රස්ත ප්‍රහාර නිසා හත්සියයක් ඝාතනය වී ඇතත් මේ කිසිම සිද්ධියක පරීකෂණ කටයුතු අවසන් කරන්නට ඉන්දීය බලධාරීන්ට නොහැකි වී ඇත. බොම්බායේ ප්‍රහාරය කෙළින්ම ඉන්දීය ආරකෂක බලධාරීන්ගේ ඇස් රතු කරවන කනේ පහරකි. එනිසා ත්‍රස්තවාදය හමුවේ තවදුරටත් සිය රටවැසියන් බිළි දෙනවා දැයි මන්මෝහන් සිං සිතිය යුතුව ඇත. එසේ නොමැතිව කිලිනොච්චිය මූලතිව් දෙස බලා සිටීමෙන් ඉන්දියාවට යහපතක් අත්වන්නේ නැත.

මේ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසු ජාතිය ඇමතූ ඉන්දීය අගමැති මන්මෝහන් සිං ප්‍රකාශ කළේ බොම්බාය ප්‍රහාරයට සම්බන්ධ සියලු දෙනාට දැඩි දඬුවම් ලබාදීමට කටයුතු කරන බවයි. ඉන්දීය ජාතිය බරපතල තර්ජනයකට මුහුණදී ඇති බවත් සමස්ත රටවැසියාම එක්ව මේ තර්ජනයෙන් ගැලවීමට කටයුතු කරනු ඇතැයි තමා බලාපොරොත්තු වන බවත් ඉන්දීය අගමැතිවරයා ප්‍රකාශ කර සිටියේය. ශ්‍රී ලාංකිකයන් වන අප ද බොම්බායට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය තරයේ හෙළා දකින අතර මේවාට වගකිව යුතු සියලුම ත්‍රස්තවාදී කණ්ඩායම් මර්දනය කළ යුතු බව අවධාරණය කරන්නෙමු. එලෙසින්ම ඩෙකෑන් මුජහිදීන්වරුන් මෙන්ම කොටි ත්‍රස්තයෝ ද කොළඹ මෙන්ම ශ්‍රී ලංකාව පුරා නොයෙකුත් ප්‍රදේශවල ත්‍රස්ත ප්‍රහාර සිය ගණනින් එල්ල කර සාමාන්‍ය වැසියන් සිය ගණනින් මරා දමා ඇති බව අප යළිත් ඉන්දීය මධ්‍යම රජයට මතක් කර දෙමු. ඉන්දීය රජය මුජහිදීන්වරු මර්දනය කිරීමට ඉන්දීය වැසියන්ගේ සහාය ඉල්ලන සේම කොටි ත්‍රස්තයන් මර්දනය කිරීමට ශ්‍රී ලංකා රජය ද ලංකාවාසීන්ගේ සහය ඉල්ලයි.

මේ බොම්බායේ ත්‍රස්ත ප්‍රහාරයෙන් හෝ ත්‍රස්තවාදයේ සැබෑ කුරිරු ප්‍රචණ්ඩත්වය ඉන්දීය බලධාරීන්ට අවබෝධ වූවා යැයි අපි සිතමු. එනිසා ප්‍රභාකරන්ගේ ද ඩෙකෑන් මුජහිදීන්වරුන්ගේ ද කිසිදු වෙනසක් නැත. එනිසා ශ්‍රී ලංකාවේ යළිත් වරක් ඉන්දීය අතපෙවීමක් සිදු වූවහොත් එය ප්‍රභාකරන් සුරැකීමක් වන අතර බොම්බායේ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියගිය සියයකට අධික පිරිසකට ද කරන බලවත් නිග්‍රහයක් වන බව පැහැදිලිය. මන්ද ඉන්දීය රජය යළිත් වරක් ප්‍රභාකරන් ආරකෂා කරන්නට කවර හෝ පියවරක් ගැනීමට සිතන්නේ නම් එය ඉතිහාසයේ බලවත්ම වැරැද්දක් වන අතරම එය ත්‍රස්තවාදයට හිස නැමීමක්ද වනු ඇත. එහෙත් බොම්බායේ ප්‍රහාරයෙන් පසු එවන් අනුවණ ක්‍රියාවලට ඉන්දියාව පෙළඹීමේ හැකියාව තවදුරටත් සීමා වූ බව නම් කිව හැකිය.

දිවයින අනුග්‍රහයෙනි

